අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 1/2008(ii)

මගේ අංකය : MOJ/E10/ අති.අධි./2022
අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍ර ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 10
2023 මාර්තු ......17

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්
සියලුම දිසා විනිසුරුවරුන්,
සියලුම මහේස්ත්‍රාත්වරුන්,
සියලුම කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්,

<u>මුරකරුවන් සේවයේ යෙදවීම සහ අතිකාල අනුමැතිය ලබා දීම</u>

මුරකරුවන් හා අධිකරණ ආරක්ෂකවරුන් මුර රාජකාරී සඳහා සේවයේ යෙදවීමට අදාළව අතිකාල දීමනා අනුමත කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2022.05.06 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 1/2008(i) හි 4.2 වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

**" 4.2 මුරකරු/අධිකරණ ආරක්ෂක යන එක් සේවක මහතෙකු හෝ සේවය නොකරන අධිකරණයන්හි මුර රාජකාරී සඳහා යොදවන සියලුම සේවක මහතුන් හට මසකට පැය 490 ක උපරිමයකට යටත්ව අතිකාල දීමනා ගෙවීම අනුමත කරමි "**

02. අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 1/2008(i) අනුව කටයුතු කිරීමේදී අධිකරණ වෙතින් නිරන්තරයෙන් විමසන කරුණු සම්බන්ධයෙන් පහත පැහැදිළි කිරීම් සිදු කරමි.

2.1 මුරකරු/අධිකරණ ආරක්ෂක සතියකට දින 06 ක් සේවය කළ යුතු අතර ඉරිදා දින හා රජයේ නිවාඩු දින සාමාන්‍ය රාජකාරී දිනයන් ලෙස සැලකිය යුතු බැවින් ඔවුන්ගේ විවේක දිනයේදී හැර අනෙකුත් රජයේ නිවාඩු දිනයන්හිදී ඔවුන්ගේ සේවා මුරය තුළ සිදු කරනු ලබන රාජකාරී සඳහා අතිකාල දීමනා ලබා ගැනීමට ඔවුන්ට හිමිකමක් නැත.

2.2 අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 1/2008(i) හි 4.1 වගන්තිය අනුව එක් සේවා මුරයක පැය 9න් ඔබ්බට සිදු කරනු ලබන අමතර රාජකාරී වෙනුවෙන් එක් මුරකරු/අධිකරණ ආරක්ෂකවරයෙකු සඳහා මසකට උපරිම පැය 144 කට යටත්ව අතිකාල දීමනා ගෙවීමට හැකියාව ඇත. 2015.07.29 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 04/2015 මඟින් ද විධිවිධාන සලසා ඇති පරිදි සුදුසු සැලැස්මක් සකස් කර ඒ අනුව සේවකයන් මුර රාජකාරියෙහි යෙදවීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතු වේ.

2.3 ප්‍රමාණවත් අධිකරණ ආරක්ෂකයින් ප්‍රමාණයක් සේවය කරන අධිකරණ සංකීර්ණයන්හි පැය 08ක සේවා මුර ක්‍රමය ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට කටයුතු කළ හැකිය.

03. රාජ්‍ය වියදම් කළමනාකරණයට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධානයන්ට දැඩිව අනුගත වෙමින් පවතින ප්‍රතිපාදන සීමාව තුළ වියදම් කළමනාකරණය කර ගනිමින් අතිකාල දීමනා ගෙවීම් කිරීම සිදු කළ යුතු බව දැඩිව අවධාරණය කරන අතර මේ සඳහා අමතර ප්‍රතිපාදන ලබා දීමක් සිදු කරනු නොලැබේ.

04. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන 2023.03.20 දින සිට ක්‍රියාත්මක වේ.

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත : 1. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව
2. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධිකරණ අමාත්‍යාංශය